හපුතලේ ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාවට අයත් සුසානභූමි 34 ක් තක්සේරු කර ඒවායේ අගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | හැකි ඉක්මනින් වෘත්තීය තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගැනීමෙන් සහා වත්කම් තක්සේරු කර එම වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සේවක ණය ලේඛනය අනුව රු.194,000 ක සේවක ණය ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | සේවක ණය ලේඛනයෙහි පවතින අඩුපාඩු සම්පූර්ණ කර යාවත්කාලීනව පවත්වාගෙන යෑමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව කර්මාන්ත ණයහිමි ශේෂය රු. 5,733,751 ක් සහ ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.3,793,796ක් වුවද, කර්මාන්ත ණයහිමි ලේඛනය සහ මුද්දර ගාස්තු ලේඛනයේ අනුව එම ශේෂ පිළිවෙලින් රු. 8,124,915 ක් සහ රු. 12,054,437 ක් විය | ලේඛන හා උපලේඛන යාවත්කාලීන කර නොසැසඳීම් වලට හේතු සොයා බලා නිවැරදි කළ යුතුවේ. | කර්මාන්ත ණයහිමි ලේඛනය සහ උපලේඛන අනුව ශේෂය අතර වෙනසක් පවතින්නේ ණයහිමි ලේඛනය යාවත්කාලීන නොවීම හේතුවෙන් මුද්දර ගාස්තුවල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව වෙනසක් පවතින්නේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විටත් මුද්දර ගාස්තු උපලේඛන ලැබී නොතිබුණු නිසාය මෙම ශේෂ ප්‍රවර්තන වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිරිවැය රු. 127,779,428 ක වත්කම් විෂයයන් 5 ක් තක්සේරු වාර්තා, ස්ථාවර වත්කම් ලේඛනය, උප ලේඛන හා සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේදී විධිමත් පරිදි වත්කම් හඳුනාගෙන තක්සේරුකර ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛන නිසි පරිදි පවත්වාගෙන යෑමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 126(vii)( ඊ) වගන්තිය | සභා බලප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර ඇති ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් ප්‍රවර්තන වර්ෂයේදී සිදුකරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ප්‍රාදේශීය සභාවට අයත් වාහන 3 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරික්ෂා කළ යුතුවේ. | ඉන්ධන දහන පරික්ෂාවන් සිදුකරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,770,817 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 6,583,012 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018 2017

| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,781,511 | 1,781,511 | 2,082,316 | 912,796 | 619,900 | 619,900 | 1,020,219 | 199,754 |
| (ii) | කුලී | 6,544,540 | 6,544,540 | 5,298,007 | 587,093 | 4,571,521 | 4,571,521 | 6,454,842 | 716,157 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 640,300 | 640,300 | 904,763 | - | 540,300 | 540,300 | 794,675 | - |
| (iv) | වෙනත් ආදායම් | 43,506,009 | 43,506,009 | 38,257,143 | 7,565,634 | 40,133,757 | 40,133,757 | 37,188,443 | 5,735,123 |
| | එකතුව | 52,472,360 | 52,472,360 | 46,542,229 | 9,065,523 | 45,865,478 | 45,865,478 | 45,458,179 | 6,651,034 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂයේ බිල් කරන ලද රු. 1,536,510 ක වරිපනම් බදු ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 796,949 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 51 ක් විය. | අයවිය යුතු බදු මුදල් අයකර ගත යුතුවේ. | වරිපනම් අයවීම කඩිනමින් නිවැරදි කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 907,515 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 813,027 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 89 ක් විය. | අයවිය යුතු හිඟ බදු මුදල් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් බදු ආදායම සම්බන්ධ කාල විශ්ලේෂණයක් සිදුකර ආදායම සභාව වෙත අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උසාවි දඩ | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු උසාවි දඩ රු. 2,396,580 ක් විය. | හිඟ උසාවි දඩ අයකර ගත යුතුවේ. | අයවිය යුතු මුදල් සහා අරමුදලට කඩිනමින් ලබා ගැනීම සඳහා පළාත් සභාව වෙත යොමුකර ඇත. |

(ආ) මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු. 12,054,437 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | අයවිය යුතු මුදල් සහා අරමුදලට කඩිනමින් ලබා ගැනීම සඳහා පළාත් සභාව වෙත යොමුකර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉටු කිරීමට අපේක්ෂිතව තිබුණු ක්‍රියාකාරකම් 07 ක් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉටු කළයුතු කාර්යයන් ඉටු කළයුතුවේ. | 2018 වර්ෂයේදී සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් වලින් ඉටු නොවුනු ක්‍රියාකාරකම් නිශ්චිතව හඳුනාගෙන ඇති අතර, ඒවා ප්‍රවර්තන වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නැවත ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට පැවත එන රු.830,593 ක කර්මාන්ත ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත ණයහිමි ලේඛනයෙහි පවතින ශේෂය පිළිබඳ පරික්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කරන අතර කර්මාන්ත ණයහිමි ලේඛනය සහ ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යෑමටත් කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 04 කට අදාලව සේවක පුරප්පාඩු 06 ක් පැවතුනි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවිය යුතුවේ. | තනතුරු පුරප්පාඩු පිළිබඳ අදාල ආයතන දැනුවත්කර ඇති අතර වත්මන් කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගනිමින් කාර්යාල කටයුතු පවත්වාගෙන යන බව දැනුම් දෙමි. |

3.4 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව පවත්වාගෙන යමි. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | 2019 වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් නිසි පරිදි සිදුකිරීමට කටයුතු කරමි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/ 2009 (01) දරන චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | 2019 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර ක්‍රියාකාරීව පවත්වාගෙනයෑමට කටයුතු කරමි. |